රේගු මන්දිරය, අංක 40, කෙලින් වීදිය, කොළඹ 11.
சுங்க இல்லம், இல. 40, பிரதான வீதி, கொழும்பு 11.
Customs House, No. 40, Main Street, Colombo 11.

වෙබ් අඩවිය / வெப் தளம் / Web Site: www.customs.gov.lk

# ශ්‍රී ලංකා රේගුව
# இலங்கைச் சுங்கம்
# Sri Lanka Customs

මගේ අංකය / எனது இல. / My No.: SLC/Media/2024/05/02

ඔබේ අංකය / உமது இல. / Your No.: ..............................

දිනය / திகதி / Date: 03 .09.2024

## මාධ්‍ය නිවේදනය

**සියළුම මාධ්‍ය ආයතන වෙත,**

**<u>කොළඹ වරායෙන් බහාළුම් නිශ්කාෂණය කිරීමේදී සිදුවන ප්‍රමාදය සම්බන්ධවයි</u>**

කොළඹ වරායෙන් දිනකට සාමාන්‍යයෙන් ආනයනික බහාළුම 1200 ත් 1500 ත් අතර ප්‍රමාණයක් රේගුව හරහා නිශ්කාෂණය කෙරේ. එය දිනකට 2500 දක්වා ඉහල යන අවස්ථාද ඇත. මෙම බහාළුම් ප්‍රමාදයකින් තොරව ආනයනකරුවන් වෙත නිදහස් කිරීමට ශ්‍රී ලංකා රේගුව සෑම උත්සහයක්ම ගන්නා නමුත් රේගුවෙන් පරිභාහිර විවිධ හේතු නිසා යම් අවස්ථාවලදී ප්‍රමාදයක් සිදුවන බව නිරීක්ෂණය කර ඇත.

භාණ්ඩ පරීක්ෂාව සඳහා දැනට ඇති අංගනවල ඇති ඉඩකඩ අවම වීම, නිශ්කාෂණ නියෝජිතයින්ගේ හා ආනයනකරුවන්ගේ ක්‍රියාකාරකම්වල ප්‍රමාදයන්, අනෙකුත් රාජ්‍ය ආයතනවල අනුමැතිය සඳහා කාලය ගත වීම, ආනයනකරුවන්ගේ ගබඩාවල ඉඩකඩ මදවීම,අල , ළූණු වැනි ආහාර ද්‍රව්‍ය පිටකොටුව ආශ්‍රිත ප්‍රදේශ වල ගොඩබෑම සඳහා රාත්‍රි කාලය තෙක් ඒවා නිශ්කාෂණය නොකර බහාළුම් පරීක්ෂණ අංගන තුල රඳවා තැබීම වැනි හේතුන් මේ සඳහා බලපාන කරුණු වේ.

කෙසේ වෙතත් බහාළුම් නිශ්කාෂණ ක්‍රියාවලිය ප්‍රමාදයකින් තොරව සිදුකිරීම සඳහා රේගුව විසින් දැනට පහත දැක්වෙන කෙටි හා දීර්ඝකාලීන ක්‍රියා මාර්ග අනුගමනය කර ඇත.

I. කෙරවලපිටිය යෝජිත බහාළුම් පරීක්ෂණ අංගනය ඉදිකිරීම කඩිනම් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයට යෝජනා ඉදිරිපත් කිරීම.
II. ආනයන බහාළුම් භෞතික පරීක්ෂාව 30%ක් දක්වා අඩුකිරීම තුලින් 70%ක් බහාළුම් බාධාවකින් තොරව වරායෙන් නිදහස් කිරීම.
III. භාණ්ඩ පරීක්ෂාව සඳහා ස්කෑනර් යන්ත්‍ර භාවිතය වැඩිකිරීම.
IV. දිගුකාමරයේ හා මිල පිරික්සුම් අංශයේ සටහන්කර සම්මත කරන වේලාවන් ප්‍රතිසංවිධනය කිරීම තුලින් දිනකට නිශ්කාෂණය කල හැකි බහාළුම් ප්‍රමාණය ඉහල දැමීම.
V. බහාළුම් නිශ්කාෂණය කිරීමේ අසාමාන්‍ය ප්‍රමාදයන් ඇති අවස්ථාවලදී අඩුඅවදානමක් ඇති බහාළුම් තෝරා භෞතික පරීක්ෂාවකින් තොරව නිදහස් කිරීම.

පොදු දුරකථන අංක/பொது தொலைபேசி இல./GENERAL TELEPHONE NOS. - 011 2143434, 011 2470945, 011 2470946, 011 2470947, 011 2470948

රේගු අධ්‍යක්ෂ ජනරාල් / சுங்கப் பணிப்பாளர் நாயகம் / Director General of Customs
දුරකථන අංක / தொ. பே. இல. / Telephone: 011 2347881, 011 2221701
ෆැක්ස් / பெக்ஸ் / Fax: 011 2446364

අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக சுங்கப் பணிப்பாளர் நாயகம் / Additional Director General of Customs

| | Admin | Corporate | Enforcement | Rev. & Serv. | Regional |
|---|---|---|---|---|---|
| දුරකථන අංක / தொ. பே. இல. / Telephone | 011 2333426 | 011 2445148 | 011 2323451 | 011 2437069 | 011 2342013 |
| | 011 2221730 | 011 2221760 | 011 2221750 | 011 2221740 | 011 2221731 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 011 2389536 | 011 2430691 | 011 2432868 | 011 2437069 | 011 2333161 |

Scanned with CamScanner

ඉහත ක්‍රමවේදයන් අනුගමනය කර ආනයනික බහාළුම් නිශ්කාෂණ කටයුතු වේගවත් කිරීමට කටයුතු සිදුකළද, සංවිධානාත්මකව සිදුකෙරෙන හොරබඩු ජාවාරම් හඳුනාගෙන ඒවා අත්අඩංගුවට ගැනීමේ දුෂ්කර කාර්ය භාරයද ශ්‍රී ලංකා රේගුව විසින් නිරන්තරයෙන්ම සිදුකරනු ලබයි. සීමිත පහසුකම් යටතේ ඉහතින් සඳහන් සේවාවන් සැපයීම සිදුකිරීමේදී රේගුවට අවදානමක් ගැනීමට සිදුවන අතර, එහිදී බදු ආදායමට, සමාජ ආරක්ෂණයට හා වෙළදාම පහසුකිරීමේ අභිප්‍රායන් ඉටුකරගැනීමට එවැනි ජාවාරම් කටයුතු ඉමහත් බාධාවක් වන බව අවධාරණය කලයුතුය.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රේගුව මගින් දැනට ආරම්භ කර ඇති බලලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) ක්‍රම වේදය තුලින් නීතිගරුක ආනයනකරුවන් හඳුනාගෙන ඔවුන්ගේ ආනයන හා අපනයන කටයුතු ඉතා අවම රේගු පාලනයක් තුලින් සිදුවන අතර, මෙම වැඩසටහනට සම්බන්ධ වී අදාල පහසුකම් ලබාගන්නා ලෙසට සියළුම ආනයනකරුවන් හා අපනයනකරුවන්ගෙන් ඉල්ලා සිටිමු. ඒ තුලින් බහාළුම් භෞතික පරීක්ෂාව අවම කොට කෙටිකාලසීමාවකින් රේගු නිශ්කාෂණ කටයුතු නම් කොට භාණ්ඩ ආනයනකරුවන් වෙත නිදහස් කිරීමට හැකිවීම තුලින් වරාය තුල ඇතිවිය හැකි තදබදය අවම කලහැකිය.

සිවලි අරුක්ගොඩ
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්
රේගු මාධ්‍ය ප්‍රකාශක

Scanned with CamScanner